# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය සඳහා තාවකාලික පදනම මත ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සහ සුළු ශ්‍රේණි සඳහා බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම් සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කල අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික සමඟ ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2021.12.10**

## පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව ප්‍රායෝගික පරීක්ෂණ ප්‍රතිඵල සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් **(kdu.ac.lk)** භාගත කර ගත හැකි ආකෘතිය මඟින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වීඩී කිත්සිරි
ලේඛකාධිකාරී
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

VD KITHSIRI
Registrar
General Sir John Kotelawala Defence University
Ratmalana

# ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි

## 01. ලිතෝ චිත්‍ර ශිල්පී (තාවකාලික)

<u>අවම සුදුසුකම්</u>

1. (i) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම සහ ලිතෝ ආටිස්ට් පේස්ට් අප් සහ ලේ අවුට් වැඩ පිළිබඳව අවුරුදු පහක (05) ක පළපුරුද්දක් තිබීම.

හෝ

(ii) කනිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අටවැනි ශ්‍රේණිය සමත් වීම සහ ලිතෝ ආටිස්ට් පේස්ට් අප් සහ ලේ අවුට් වැඩ පිළිබඳව අවුරුදු හතක (07) පළපුරුද්දක් තිබීම.

2. ඉහත දක්වා ඇති සුදුසුකම් වලට අමතරව ලිතෝ මුද්‍රණ තල පෙර සැකසුම සහ පරිගණක ආශ්‍රිත පොත් සැකසුම පිළිබඳ පිළිගත් ආයතනයක එක් අවුරුද්දක පලපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

3. වයස: අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

දෛනික වැටුප:
රු. 2000/- ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

## 02. කළමනාකරණ සහකාර (ගිණුම් අංශය සඳහා) (තාවකාලික)

<u>අවම සුදුසුකම්</u>

1. (i) අ.පො.ස (සා.පෙළ) විභාගයේ සිංහල භාෂාව/දෙමළ භාෂාව,ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් එක් වරකදී සමත්වී තිබීම.

සහ

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයේ සියලුම විෂයන් එක් වරකදී සමත් වී තිබීම.

පහත සඳහන් සුදුසුකම් සහිත අයවලුන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

පිළිගත් ආයතනයක් වෙතින් ලබාගත් මාස (06) කාලයකට නොඅඩු පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකම්.

සහ

පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද.

ඉහත දක්වා ඇති සුදුසුකම් වලට අමතරව පහත දක්වා ඇති අතිරේක සුදුසුකම් ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය වේ.

(iii) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විදුහල / තාක්ෂණ විදුහලේ ගිණුම්කරන තාක්ෂණ ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් සමාන සුදුසුකම්.

හෝ

(iv) අ.පො.ස (උ.පෙළ) විභාගයේ සියලුම විෂයයන් වාණිජ විෂය ධාරාවෙන් සමත් වී තිබීම.

වයසඃඅයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ වයස අවු. 30 ට නොවැඩි විය යුතුය.

දෛනික වැටුපඃ
රු. 2000/- ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

# සුළු ශ්‍රේණිය

## 03. වැඩ සහායක (තාවකාලික)

සුදුසුකම්

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

2. මුද්‍රණාලයක සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

4. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

දෛනික වැටුප

රු. 1,500/-ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

## 04. ලිතෝ ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු (තාවකාලික)

<u>සුදුසුකම්</u>

1. (i) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම.

සහ

ඔෆ්සෙට් යන්ත්‍ර ක්‍රියාකරුවකු ලෙස වසර 05කට නොඅඩු පලපුරුද්දක් තිබිය යුතුය.

හෝ

2. (i) කනිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ 08 ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

සහ

(ii) ඔෆ්සෙට් යන්ත්‍ර ක්‍රියාකරුවකු ලෙස වසර 07කට නොඅඩු පලපුරුද්දක් තිබිය යුතුය.

3. වර්ණ දෙකෙහි ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක වසර 03ක පලපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

4. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

<u>දෛනික වැටුප</u>

රු. 2,000/-ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

## 05 . ලිතෝ ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර සහායක (තාවකාලික)

<u>සුදුසුකම්</u>

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

2. පිළිගත් මුද්‍රණ ආයතනයක ඕෆ්සෙට් යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස අවම, අවුරුදු 01ක පළපුරුද්ද හෝ පිළිගත් ආයතනයක ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ මාස 06ක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

4. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

<u>දෛනික වැටුප</u>

රු. 1,750/-ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.